# ‘දුම්කොළ වලින් නිදහස් පරපුරක්’ (Tobacco-Free Generation)

2010 වසරෙන් පසු උපත ලද සෑම දරුවෙකුම දුම්කොළ සමාගමේ කූඨ උපක්‍රම වලින් ආරක්ෂා කිරීමට සහ තරුණ පරම්පරාව අතර දුම්කොළ භාවිතය සහ අලෙවිය සදහටම තුරන් කිරීමේ ජාතික ප්‍රතිපත්තියක්.

## ‘දුම්කොළ වලින් නිදහස් පරපුරක්’ යනු කුමක්ද?

2010 ජනවාරි 1 වැනිදා හෝ ඉන් පසුව උපත ලැබූ පුද්ගලයන්ට දුම්කොළ නිෂ්පාදන අලෙවි කිරීම අදියරෙන් අදියර තහනම් කිරීම වෙනුවෙන් දියත් වන මහජන සෞඛ්‍ය වැඩපිළිවෙළකි. මෙමඟින් නව පරපුර ඔවුන්ගේ ජීවිත කාලය පුරාම දුම්කොළ හානිවලින් ආරක්ෂා කර ගැනීමට රජය බලාපොරොත්තු වේ.

මෙහිදී සාමාන්‍ය වයස් සීමා පැනවීමකට එහා යමින්, නීත්‍යානුකූලව දුම්පානය කළ හැකි වයස සෑම වසරකදීම, වසරකින් ඉහළ දැමීම සිදු කෙරේ. ඒ අනුව, නම් කරන ලද දිනට පසුව උපන් කිසිඳු පුද්ගලයෙකුට තම ජීවිත කාලය තුළ කිසිදා නීත්‍යානුකූලව දුම්කොළ නිෂ්පාදන මිලදී ගැනීමට අවස්ථාව ලැබෙන්නේ නැත.

සාමාන්‍ය වයස් සීමා කිරීම් මෙන් නොව, මෙම ප්‍රතිපත්තිය ජනගහනයේ වර්ධනයත් සමඟ ඉදිරියට ඇදෙයි. ඒ අනුව ආරක්ෂා වන පිරිස වසරින් වසර පුළුල් වන අතර, දශක කිහිපයක් යනවිට එය මුළු මහත් සමාජයම ආවරණය කරනු ඇත.

## ශ්‍රී ලංකාවේ යෝජනාව

2025 වසරේදී, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් මෙම ප්‍රතිපත්තිය ලංකාවට හඳුන්වා දෙන ලෙස ගරු සෞඛ්‍ය අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරන ලදී. මෙම යෝජනාවට අනුව, 2010 වසරේදී හෝ ඉන් පසුව උපත ලැබූ කිසිඳු අයෙකුට දුම්කොළ නිෂ්පාදන අලෙවි කිරීම සපුරා තහනම් වේ. එනම්, 2031 වසරේදී වයස අවුරුදු 21 සපිරෙන හෝ ඊට අඩු තරුණ දරුවන්ට කිසිදා නීත්‍යානුකූලව දුම්කොළ මිලදී ගැනීමට නොහැකි වනු ඇත.

2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනතේ අන්තර්ගතයන් ද මෙම සංකල්පයේ අරමුණු ශක්තිමත් කරන අතර, මානව සෞඛ්‍යය සහ ජීවත්වීමේ අයිතිය සුරකින ‘මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය’ වැනි ජාත්‍යන්තර මානව හිමිකම් රාමුවලට ද මෙය මනාව අනුකූල වේ.

## මෙවැනි ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍ය වන්නේ ඇයි?

| | | |
|---|---|---|
| දුම්කොළ නිෂ්පාදන වසරකට ශ්‍රී ලාංකිකයන් | ශ්‍රී ලංකාව තුළ දිනපතා | දුම්කොළ ආශ්‍රිත රෝගාබාධ හේතුවෙන් දිනකට ශ්‍රී ලාංකිකයන් |
| **15,000+** | **රු.කෝටි 56** | **40–50** |
| මරා දමයි. | සිගරට් සඳහා වියදම් කරයි. | මිය යයි. |

- දුම්කොළ යනු භාවිත කරන්නන් දෙදෙනෙකුගෙන් එක් අයෙක් මරා දමන ලොව එකම නිෂ්පාදනයයි. මෙලෙස අකාලයේ මිය යන්නේ අපේම පියවරුන්, සහෝදරයන් සහ රටේ ශ්‍රම බළකායට දායක විය හැකි වටිනා තරුණ පරපුරයි.
- දුම්කොළ නිසා සිදුවන රෝගාබාධ වෙනුවෙන් රජය වාර්ෂිකව රුපියල් බිලියන ගණනක මහජන මුදලක් වැය කරයි. තරුණයින් දුම්පානය ආරම්භ කිරීම වැළැක්වීම මඟින් කාලයත් සමඟ මෙම දැවැන්ත ආර්ථික බර සැලකිය යුතු ලෙස අඩු කරගත හැකිය.
- දුම්කොළ සමාගම් විවිධ කූඨ උපක්‍රම යොදාගනිමින් දරුවන් කුඩා කල සිටම ඔවුන්ගේ පාරිභෝගිකයන් කිරීමට උත්සාහ කරයි. ‘දුම්කොළ වලින් නිදහස් පරපුරක්’ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මෙම සදාචාර විරෝධී ක්‍රියා වලට බාධකයක් වේ.
- දුම්පානය කරන්නන් සෞඛ්‍ය ගැටලු හේතුවෙන් නිතර අසනීප නිවාඩු ලබා ගැනීමට පෙළඹෙන අතර, සේවා ස්ථානය තුළ ඔවුන්ගේ ඵලදායිතාව ද අඩු වේ. මෙම නව ප්‍රතිපත්තිය මඟින් ඵලදායී සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බළකායක් බිහිවන අතර, එය පවුල් ආර්ථිකයට, ව්‍යාපාරවලට මෙන්ම සමස්ත ජාතික ආර්ථිකයටම විශාල ශක්තියකි.
- පර්යේෂණවලින් හෙළි වී ඇත්තේ දුම්කොළ සඳහා නාස්ති කරන මුදල්, වෙනත් අත්‍යවශ්‍ය භාණ්ඩ හෝ සේවා සඳහා යොමු කළහොත් එමඟින් රටේ ආර්ථිකය තවදුරටත් උත්තේජනය වන බවයි. මෙලෙස මුදල් සංසරණය වීම හරහා විවිධ ක්ෂේත්‍රයන්හි නව රැකියා අවස්ථා බිහිවන බැවින්, දුම්කොළ කර්මාන්තය වැසී යාමෙන් අහිමි වන රැකියා සඳහා වඩාත් හොඳ විකල්ප ඉබේම නිර්මාණය වේ.

- සිගරට් ඇතුළු දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන පුද්ගලයන්ගේ සතුට, නිදහස සීමා කරයි. මෙම යෝජනාව මඟින් පුද්ගලයන්ව නිදහසෙන් සතුටෙන් තැබීමට ඉඩ සලසයි.

## ගෝලීය උදාහරණ

### මාලදිවයින

දුම්කොළ වලින් නිදහස් පරපුරක් ප්‍රතිපත්තිය ලොව ප්‍රථම වරට ක්‍රියාත්මක කළ රටයි. ඒ අනුව 2007 ජනවාරි 1 වැනිදා හෝ ඉන් පසුව උපන් කිසිඳු පුද්ගලයෙකුට දුම්කොළ නිෂ්පාදන මිලදී ගැනීම, භාවිතය හෝ ඔවුන්ට විකිණීම මාලදිවයින තුළ සපුරා තහනම් වේ.

### එක්සත් රාජධානිය

මෑතකදී ‘Tobacco and Vapes Bill’ යන පනත නීතිගත කරමින් දුම්කොළ වලින් නිදහස් පරපුරක් බිහි කිරීමේ ප්‍රතිපත්තිය වැළඳ ගත්තේය. ඒ අනුව 2008 වසරෙන් පසු උපන් කිසිවෙකුට සිගරට්, සුරුට්ටු, දුම්කොළ, දුම් රහිත දුම්කොළ හෝ විද්‍යුත් සිගරට් නිෂ්පාදන අලෙවි කිරීම සදහටම තහනම් කර ඇත.

## කාලයත් සමඟ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන ආකාරය

| | |
|---|---|
| **වර්තමානය** | බලධාරීන්, විද්වතුන් සහ සිවිල් සංවිධාන එක්ව ‘දුම්කොළ වලින් නිදහස් පරපුරක්’ ප්‍රතිපත්තිය රජයට විධිමත් ලෙස යෝජනා කරයි. |
| **ප්‍රතිපත්තිය සම්මත කිරීම** | 2010 හෝ ඉන් පසු උපත ලැබූ සැමට දුම්කොළ නිෂ්පාදන අලෙවිය නීතිමය වශයෙන් ස්ථිරවම තහනම් කෙරේ. |
| **2031 වසරේ සිට** | එම වසරේදී වයස අවුරුදු 21 සපුරන දරුවන්ට සහ ඉන් පසුව එළඹෙන සෑම පරම්පරාවකටම කිසිදා නීත්‍යානුකූලව දුම්කොළ මිලදී ගත නොහැකි වේ. මේ අනුව ආරක්ෂිත පරම්පරාව වසරින් වසර වර්ධනය වේ. |
| **දශක කිහිපයකට පසු** | මෙම ප්‍රතිපත්තිය රටේ සමස්ත ජනගහනයම ආවරණය කරයි. ශ්‍රී ලංකාව දුම්කොළ උවදුරෙන් මුළුමනින්ම නිදහස් වූ දේශයක් බවට පත්වේ! |

### ඔබට කළ හැකි දේ කුමක්ද?

ප්‍රතිපත්තියේ වාසි පිළිබඳව අන් අයව දැනුවත් කරන්න | ප්‍රතිපත්තිය හඳුන්වාදීම වෙනුවෙන් සක්‍රියව පෙනී සිටින්න | දුම්කොළ සමාගමේ කූඨ උපක්‍රම හෙළි කරන්න

**Alcohol and Drug Information Centre**
40/18, Park Road, Colombo 5
+94 112 584416, +94 112 592515
www.adicsrilanka.org